# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1975/41 - 2016 ජූලි මස 12 වැනි අඟහරුවාදා - 2016.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1251, නැටිය ග්‍රාම නිලධාරි වසමේ, නැටිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අ. ග. පි. 89හි පත්‍ර 17 අතිරේකය 15 හි දැක්වෙන පහත විස්තර සඳහන් ඉඩම් කැබලි අට (08).

01. **කැබලි අංක 814**
ඉඩමේ නම: නුවරකන්ද කැලේ, පන්සලේ මූකලාන, තලා කොළහින්න සහ බද්දරලාගේ ගල්හින්න; විස්තරය: වත්ත, ලඳුකැලෑව; හිමිකම් කියන අය: මහින්ද බාලසූරිය; ප්‍රමාණය: හෙක්. 0.0041.

02. **කැබලි අංක 815**
ඉඩමේ නම: නුවරකන්ද කැලේ, පන්සලේ මූකලාන, තලා කොළහින්න සහ බද්දරලාගේ ගල්හින්න; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: මහින්ද බාලසූරිය; ප්‍රමාණය: හෙක්. 0.0277.

03. **කැබලි අංක 816**
ඉඩමේ නම: නුවරකන්ද කැලේ, පන්සලේ මූකලාන, තලා කොළහින්න සහ බද්දරලාගේ ගල්හින්න; විස්තරය: වත්ත, අවුරුදු 8-20ක් වයසැති පොල් ගස් 15ක් ඇත; හිමිකම් කියන අය: මහින්ද බාලසූරිය; ප්‍රමාණය: හෙක්. 0.6732.

04. **කැබලි අංක 817**
ඉඩමේ නම: නුවරකන්ද කැලේ, පන්සලේ මූකලාන, තලා කොළහින්න සහ බද්දරලාගේ ගල්හින්න; විස්තරය: වත්ත, අවුරුදු 8-20ක් වයසැති පොල් ගස් 05 ක් ඇත; හිමිකම් කියන අය: මහින්ද බාලසූරිය; ප්‍රමාණය: හෙක්. 0.1637.

05. **කැබලි අංක 818**
ඉඩමේ නම: -; විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0271.

06. **කැබලි අංක 819**
ඉඩමේ නම: -; විස්තරය: ඇළ; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0103.

07. **කැබලි අංක 820**
ඉඩමේ නම: නුවරකන්ද වත්ත, පන්සලේ මූකලාන, තලා කොළහින්න සහ බද්දරලාගේ ගල්හින්න; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: මහින්ද බාලසූරිය; ප්‍රමාණය: හෙක්. 0.0181.



මෙම අති විශේෂ *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

08. **කැබලි අංක 821**

ඉඩමේ නම: නුවරකන්ද වත්ත, පන්සලේ මූකලාන, තලා කොළහින්න සහ බද්දරලාගේ ගල්හින්න; විස්තරය: වත්ත, ලඳු කැලෑව; හිමිකම් කියන අය: මහින්ද බාලසූරිය; ප්‍රමාණය: හෙක්. 0.0092.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජූලි මස 29 වැනි දින පෙ. ව. 10.00ට වාරියපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2016 ජූලි මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වාභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. එම්. එච්. එස්. කේ. ජයලත්,
ප්‍රාදේශීය ලේකම්,
වාරියපොල.

2016 ජූලි මස 07 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

07 - 1076

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කරගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**
**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

*ප්‍රාදේශීය ලේකම් යොමු අංකය* : 6/3/7/15/11/7/34.
ඉඩම් *අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2007/MV/117C.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ 1904/33 හා 2015.03.04 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පිටු අංක 3A හි අංක 37 යටතේ පළ වූ භූ. මු. පි. 18, අතුරු පිඹුරු අංක 64, පත්‍ර 47 දරන සැලැස්මට අයත් කැබලි අංක 2413හි ප්‍රමාණය හෙක්ටයාර් 0.0292ක් ලෙස සඳහන් වුවද එය හෙක්ටයාර් 0.0792 යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ආර්. බී. එන්. බී. කරුණාතිලක,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2016 ජූලි මස 04 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 1077

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.